# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 නොවැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 නොවැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 21.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 7.50 යි.**

## 2004 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 නොවැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 17/2004.

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2004 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ –

(අ) "අනුප්‍රමාණ අනුව අය කර ගනු ලැබිය යුතු ය:" යන වචනවල සිට එහි (ii) වන අනුඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"අනුප්‍රමාණ අනුව, එනම් :–

(i) 2002 අගෝස්තු මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2004 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා–

(අ) බද්ද අයකළ හැකි, දෙවන උපලේඛනයේ සඳහන් ශූන්‍ය අනුප්‍රමාණගත සැපයුම් නොවන, භාණ්ඩ හා සේවාවල වටිනාකම මත සියයට දහයක අනුප්‍රමාණය අනුව ; (එහි බදු ඛණ්ඩය 1/11 ක් වේ.) අයකර ගනු ලැබිය යුතු ය.

(ආ) බද්ද අයකළ හැකි, ශූන්‍ය අනුප්‍රමාණගත සැපයුම් නොවන, බදු අයකළ හැකි අනෙකුත් සියලු භාණ්ඩ හා සේවාවල වටිනාකම මත සියයට විස්සක අනුප්‍රමාණය අනුව, (එහි බදු ඛණ්ඩය 1/6 ක් වේ.) අයකර ගනු ලැබිය යුතු ය.

[

(ii) 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, අවස්ථාවෝචිත පරිදි සපයනු ලබන හෝ ආනයනය කරනු ලබන බිංදුවේ ප්‍රතිශතය මත බදු අයකළ හැකි භාණ්ඩ හා සේවා නොවන, භාණ්ඩ සහ සේවාවල වටිනාකම සියයට පහළොවක අනුප්‍රමාණය අනුව (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ.) අය කර ගනු ලැබිය යුතු ය.”.

(ආ) එහි අතුරු විධානයේ “අයකරනු නොලැබිය යුතු ය.” යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

“අයකරනු නොලැබිය යුතු ය:

එසේම තවදුරටත් 2003 දෙසැම්බර් මස 31 දින දී හෝ ඊට ප්‍රථම ඇතුළත් වන ලද කුලී සින්නක්කර ගිවිසුමක් නොවූ සමාලෝචනයට යටත් නොවන ගිවිසුමක් යටතේ කරන ලද සැපයුමක් වූ ද ඒ සැපයුම ඒ ගිවිසුම ඇතුළත නිශ්චිතවම හඳුන්වා ඇත්තා වූ ද අවස්ථාවක 5 වන වගන්තියේ (9) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද 2004 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ ඉන් පසුව ඒ ගිවිසුම යටතේ කරන ලද බදු අයකළ හැකි සැපයුමක් මත ගෙවිය යුතු බද්ද, ඒ ගිවිසුමට ඇතුළත් වූ අවස්ථාවේ දී පැවති බදු අනුප්‍රමාණය අනුව ආගණනය කළ යුතු ය.”

“(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

“(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද–

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි යම් තේ නිෂ්පාදකයකු විසින් ලියාපදිංචි තේ බ්‍රෝකර්වරයකුට කොළඹ තේ වෙන්දේසියේ දී විකිණීමට සපයන ලද තේ එම බ්‍රෝකර්වරයා විසින් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ ලියාපදිංචි තේ අපනයනකරුවකු විසින් මිල දී ගෙන ඇති අවස්ථාවක, එම තේ බ්‍රෝකර්වරයා විසින් කොමසාරිස් ජනරාල්වරයා නියම කර ඇති පරිදි එම තේ බැහැර කිරීම පිළිබඳ සැසඳුම් ලේඛන සපයන තෙක් එම තේ සැපයුම සඳහා අයවිය යුතු බදු ගෙවීම කොමසාරිස් ජනරාල්වරයා විසින් විලම්බනය කරනු ලැබිය යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින් ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන අනුමත කරන යම් විදේශ රජයක් විසින් හෝ ආධාර සපයන ආයතනයක් විසින් හෝ සපයන ලද අරමුදල් ප්‍රයෝජනයට ගෙන, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවකු ලෙස ගිවිසුමකට ඇතුළත් වී ඇති තැනැත්තකුට, ලියාපදිංචි තැනැත්තකු විසින්, බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයීමේ දී, එම භාණ්ඩ හෝ සේවා සැපයුමේ වටිනාකම රුපියල් විසිදහසක් ඉක්මවන අවස්ථාවක, ඒ කොන්ත්‍රාත්කරු විසින් එම භාණ්ඩ හෝ සේවා මිල දී ගත් මාසයේ අවසානයේ සිට මාස තුනක කාලයක් සඳහා එම බදු අයකළ හැකි යම් භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා අයවිය යුතු බදු ගෙවීම කොමසාරිස් ජනරාල්වරයා විසින් විලම්බනය කරනු ලැබිය යුතු ය.

(ආ)ඡේදය යටතේ විලම්බනය කිරීමක් කරන ලද්දේ යම් ලියාපදිංචි තැනැත්තකු සඳහා ද එම සැපයුම් මත අයවිය යුතු බද්ද ඔහු විසින් අයකර ගනු ලබන තුරු එම සැපයුම වෙනුවෙන් නිමැවුම් බද්ද සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් නොමැති විය යුතු ය.''.

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ, දෙවන අතුරු විධානයේ (ආ) ඡේදයේ "ඉහළ වටිනාකමක් ඇති පිරියත, යන්ත්‍ර හෝ අනෙකුත් උපකරණ" යන වචන වෙනුවට–

"ඉහළ වටිනාකමක් ඇති පිරියත, යන්ත්‍ර හෝ අනෙකුත් උපකරණ හෝ ප්‍රදර්ශන භාණ්ඩ ලෙස සහ යම් තාක්ෂණික නිරූපණයක් සඳහා යොදා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ" යන වචන ආදේශ කිරීමෙන් ;

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ඇ) ඡේදයේ "අපොහොසත් වන සැපයුම්කරුවකු විසින්," යන වචන වෙනුවට " අපොහොසත් වන සැපයුම්කරුවකු විසින්; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) සපයනු ලබන භාණ්ඩ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් වෙන්දේසියකින් 2002 අගෝස්තු මස 1 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාව තුළ විකිණීම සඳහා මිල දී ගත්, තේ වලින් සංයුක්ත වන අවස්ථාවක යම් තැනැත්තකු විසින්; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වගන්තියේ (1) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ,

(අ) (ii) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට, පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) යම් විදේශීය නෞකාවක්, ගුවන් යානයක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් වෙළෙඳ නෞකාවක් අලුත්වැඩියා කිරීමකට හෝ මුහුදු නැව් බඩු කන්ටේනරයක් යථාවත් කිරීමට;"

(ආ) එම ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iiඅ) ආනයන අපනයන වෙළෙඳාම සඳහා තාවකාලිකව ගබඩා කර නැවත අපනයනය කිරීමේ වෙළෙඳාම යටතේ ප්‍රති අපනයන කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් භාණ්ඩ;"

(ඇ) ඒ ඡේදයේ (vii) අනුඡේදය ඉවත් කිරීමෙන් ;

(2) (ආ) ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) (ආ) ඡේදයේ සඳහන් සේවාවක් නොවන හා ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී පාවිච්චි කිරීම හෝ උපයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට සපයන වෙනත් යම් සේවාවක් සඳහා සම්පූර්ණ ගෙවීම ශ්‍රී ලංකාවේ බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්, ඒ වෙනත් සේවා. ශුන්‍ය අනුප්‍රමාණ ගත කළ යුතු ය."

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම එක් එක් බදු අයකළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසු එළඹෙන මාසයේ අවසන් දිනට වඩා පසු නොවී" යන වචන වෙනුවට "සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම, එක් එක් බදු අයකළ හැකි කාලසීමාව ඉකුත් වන මාසයේ පහළොස්වන දිනයට වඩා පසු නොවී" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. —

ප්‍රධාන ප්‍රඥප්තියේ 21වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානයේ "අවුරුදු තුනකට අඩු කාලයක් සඳහා කල්බදු ගිවිසුම යටතේ සපයන ලද භාණ්ඩ වෙනුවෙන්" යන වචනවල සිට එහි අවසානය දක්වා ඇති වචන වෙනුවට "2003 ජූලි මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2004 ජනවාරි මස 1 වන දිනට ප්‍රථම ඇතුළත් වන ලද කල්බදු ගිවිසුමක් යටතේ සපයන ලද භාණ්ඩ වෙනුවෙන් යෙදවුම් බද්ද, එවැනි භාණ්ඩ සඳහා අයකරන බද්ද සියයට දහයට වැඩිවුවත්, සියයට දහයක හෝ ඊට අඩු අනුප්‍රමාණයක් අනුව ගණනය කළ යුතු ය:

එසේම තවදුරටත්, තමාගේ බදු අයකළ හැකි සැපයුම් සියල්ල හෝ ඉන් කොටසක් සඳහා සියයට දහයේ අනුප්‍රමාණය අනුව නිමැවුම් ගණනය කරන යම් තැනැත්තකුට, ලොරියක් හෝ මෝටර් කෝච් රථයක් නැතහොත් මෝටර් වැගන් රථයක් සඳහා වන විට දී හැර, ඔහුට ලැබුණු එම සැපයුම්වල වටිනාකම මත සියයට දහයකට වැඩි අනුප්‍රමාණයක් මත ඒ තැනැත්තා විසින් යෙදවුම් බද්ද ගෙවා තිබෙන අවස්ථාවක වුව ද, මේ පනත යටතේ ඉඩදිය හැකි යෙදවුම් බද්ද වශයෙන් ඒ සැපයුම වෙනුවෙන් සියයට දහයේ අනුප්‍රමාණය අනුව පමණක් අඩු කිරීමට හිමිකම ලැබිය යුතු ය.

මෙම උපවගන්තියේ කාර්ය සඳහා –

"ලොරිය" සහ "මෝටර් කෝච් රථය" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ පිළිවෙලින් එම යෙදුම්වල දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"වැගන් " යන යෙදුමට 1995 අංක 16 දරන මුදල් පනතේ ඊට ලබා දී ඇති අර්ථය ම ඇත්තේ ය."

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) ලියාපදිංචි නොමැති තැනැත්තකු විසින් ඔහුගේ ඉඩම හා ගොඩනැගිලි, කුලී නිවැසි ගිවිසුමකට අනුව, ලියාපදිංචි තැනැත්තකුට බද්දට දුන් අවස්ථාවක, ඒ ඉඩමේ සහ ගොඩනැගිල්ලේ වෙනත් ලියාපදිංචි තැනැත්තකු විසින් සපයනු ලබන සේවා සඳහා දරන ලද යම් වියදමක් වෙනුවෙන් කිසි යෙදවුම් බද්දකට හිමිකම් කියා සිටීමට ලියාපදිංචිය නොමැති තැනැත්තාට හිමිකම නොමැති වුව ද, පළමු කී ලියාපදිංචි තැනැත්තාට ඉල්ලා සිටීමට හිමිකම තිබෙන යෙදවුම් බදු මුදල් ප්‍රමාණය තීරණය කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකිවනු පිණිස, ඔහු සෑහීමට පත්වන ප්‍රමාණවත් සාක්ෂි සැපයුවහොත් එම ඉඩමේ සහ ගොඩනැගිල්ලේ සපයන සේවා සම්බන්ධයෙන් ඔහු විසින් එම කුලී නිවැසි ගිවිසුම පවතින කාලය තුළ දරන ලද වියදම් වෙනුවෙන් කොමසාරිස් ජනරාල්වරයා තීරණය කරන යෙදවුම් බදු ප්‍රමාණය ඉල්ලා සිටීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය."

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "ලියාපදිංචි නොමැති තැනැත්තකු" යන වචනවල සිට "ඔහුට අයිතිය ඇත්තේ ය. "දක්වා වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(5) 21 වන වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ යම් වාර්තාවක් සපයා ඇති අවස්ථාවක සහ ඒ වාර්තාව අදාළවන යම් බදු අයකළ හැකි කාලසීමාවක් අවසානයේ දී, මේ පනත යටතේ ඉඩදිය හැකි යෙදවුම් බද්දේ ප්‍රමාණය, නිමැවුම් බද්දේ ප්‍රමාණය ඉක්මවන්නේ නම් එම යෙදවුම් බද්දේ අතිරික්තය ආපසු නොගෙවිය යුතු අතර බදු අයකළ හැකි ඊළඟ අනුප්‍රාප්තික කාලසීමාවේ නිමැවුම් බද්දට යනාදී වශයෙන් හිලව් කරගෙන යා යුතු ය. එම අතිරික්තය ප්‍රථමයෙන් මතු වූ බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට හය මාසයක කාලයක් ඇතුළත එසේ හිලව් නොවී පවතින අතිරික්තයේ ශේෂය, 58 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ආපසු ගෙවනු ලැබිය යුතු

අතර එය එසේ ආපසු ගෙවනු නොලැබූ අවස්ථාවක, එම ආපසු ගෙවීම කරනු ලැබිය යුතු වූ බදු අයකළ හැකි කාලසීමාවේ අවසානයේ සිට එක් මාසයක් ඉකුත් වන දිනයෙන් ආරම්භව, ආපසු ගෙවීමේ දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, 59 වන වගන්තියෙන් නියමිත අනුප්‍රමාණ අනුව, 59 වන වගන්තියේ අතුරු විධානයේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම මුදල සඳහා පොළිය ගෙවිය යුතු ය:

එසේ වුව ද, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 අගෝස්තු මස 1 වන දින හෝ ඉන් පසුව ආපසු ගෙවිය යුතු අතිරික්ත යෙදවුම් බද්දක ශේෂයක් 2002 අගෝස්තු මස 1 වන දිනට ආපසු ගෙවීමට ඉතිරිව ඇති අවස්ථාවක මේ පනත යටතේ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා අයවිය යුතු යම් නිමැවුම් බද්දකින් ඒ අතිරික්තය අඩුකර නොගත යුතු අතර, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ ඒ අනුව එය ආපසු ගෙවිය යුතු ය:"

(4) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ -

(i) "ව්‍යාපෘතියක් කරගෙන යාම" යන වචනවල සිට "භාරගන්නා බව" යන වචනය දක්වා කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා යම් ව්‍යාපාරයක් හෝ යම් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව සහ ඒ ආරම්භ කිරීමේ සිට මාස තිහක කාලයක් ඇතුළත දී ඒ ව්‍යාපාරයෙන් හෝ ව්‍යාපෘතියෙන්, බදු අයකළ හැකි සැපයුමක් කිරීමට භාරගන්නා බව"

(ii) ඒ උපවගන්තියේ "බදු අයකළ හැකි සැපයුම් කිරීමට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"බදු අයකළ හැකි සැපයුම් ආරම්භ කිරීමට ප්‍රමාණවත් නොවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ ලියාපදිංචි තැනැත්තා විසින් ඒ බවට කරන ඉල්ලීමක පදනම මත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පවත්නා ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් සඳහා ඒ වන විට ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු විසින්, ඒ බව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී ඒ ලියාපදිංචිය, අලුත් ව්‍යාපාරය හෝ ව්‍යාපෘතිය ඇතුළත් වන සේ දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එසේ දීර්ඝ කළවිට මේ උපවගන්තියේ විධිවිධාන ඒ අලුත් ව්‍යාපාරයට හෝ ව්‍යාපෘතියට අදාළ විය යුතු ය;" තව ද

(5) ඒ වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(9) (3) උපවගන්තියේ පළමුවන හා දෙවන අතුරු විධානවල කවර විධිවිධානයක් තිබුන ද 2004 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක දී ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුමක් හෝ සියයට දහයක අනුප්‍රමාණය මත දිගින් දිගට බදු අයකරන ලද සැපයුමක් කළ යම් ලියාපදිංචි තැනැත්තකුට එසේ ගෙවන ලද යෙදවුම් බද්දෙන් සියයට හැත්තෑ පහක් ඔහු විසින් ලබා ගන්නා ලද එම සැපයුම්වල වටිනාකමින් සියයට විසිපහක අනුප්‍රමාණය මත අඩු කිරීමට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, එම යෙදවුම් බද්ද 2004 ජනවාරි මස 1 වන දිනට පූර්ව බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, සියයට විස්සක අනුප්‍රමාණයක් මත බදු අයකරන ලද සැපයුමක් කළ යම් ලියාපදිංචි තැනැත්තකු ඉහත සඳහන් සීමා කිරීමට යටත් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ III අ පරිච්ඡේදයේ ශීර්ෂය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ III අ පරිච්ඡේදයට පෙරාතුව දැක්වෙන ශීර්ෂයේ " නිශ්චිත ආයතන මගින් සපයනු ලබන මූල්‍ය සේවා" යන වචන වෙනුවට "යම් නිශ්චිත ආයතනයක් හෝ යම් තැනැත්තකු විසින් සපයනු ලබන මූල්‍ය සේවා" යන වචන ආදේශ කිරීමෙන් එම ශීර්ෂය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ශ්‍රී ලංකාවෙහි මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය කර ගෙන යන යම් නිශ්චිත ආයතනයක් විසින් කරනු ලබන ශ්‍රී ලංකාවෙහි මූල්‍ය සේවා සැපයීම්වලින්, 2003 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි," යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ශ්‍රී ලංකාවෙහි මූල්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් එම මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය කර ගෙන යන –

(i) යම් නිශ්චිත ආයතනයක් විසින් 2003 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2003 ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන කාල සීමාව තුළ ; සහ

(ii) යම් තැනැත්තකු විසින් 2003 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, ක්‍රියාත්මක වන පරිදි," සහ

(2) එම වගන්තියේ පැති සටහනෙහි "නිශ්චිත ආයතන" යන වචන වෙනුවට "නිශ්චිත ආයතන හෝ යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්.

9 ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය, එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

"(4) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2003 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් මාසයක් සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය අදාළ වන යම් තැනැත්තකු යටත් වන බදු මුදල (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ගණන් බැලීමට තමා අදහස් කරන බව එම තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය හැකි ය. එසේ වුවද කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත දැනුම් දීම යැවීමෙන් පසු කාලසීමාව කෙරෙහි (5) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු අතර ඒ දැනුම් දීම අවලංගු කළ නොහැක.

(5) බදු මුදල ගණන් බැලීමේ කාර්ය සඳහා –

(අ) පළමුවන උපලේඛනයේ (xi) වන අයිතමය යටතේ නිදහස් කරන ලද සැපයුම් නොවන එහෙත් මේ පරිච්ඡේදය යටතේ බදු අය කළ හැකි, නිදහස් කරන ලද සැපයුම්වලට ;

(ආ) ශුන්‍ය අනුප්‍රමාණ ගත කරන ලද සැපයුම්වලට ;

(ඇ) මේ පරිච්ඡේදය යටතේ බදු අයකළ හැකි සැපයුම්වලට අදාළ අගය එකතු කිරීම හැර මෙම පනත ප්‍රකාරව බදු ගෙවා ඇති හෝ ගෙවිය යුතු, බදු අයකළ හැකි සැපයුම්වලට ;

(ඈ) මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව “නිශ්චිත ආයතනයක් ” ලෙස සලකනු ලබන ආයතනයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් ප්‍රධාන වශයෙන් මුල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවාවලට සමාන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකු ඇතුළත් නොවන සමාගම් සමූහයක් යම් කිසි ණය මුදලක්, අත්තිකාරම් මුදලක් හෝ බැරපතකට අදාළ අන්තර් සමාගම් ගණුදෙනුවලින් පැන නගින හෝ උපචිත වන පොළී මත ලාභයකට හෝ ආදායමකට ;

(ඉ) මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව “නිශ්චිත ආයතනයක් ” නොවන හෝ ශ්‍රී ලංකා මහබැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් ප්‍රධාන වශයෙන් මුල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකුට උපදින හෝ උපචිත වන ලාභ හෝ ආදායම් හැර, සේවා නියුක්තිකයන් විසින් පමණක් දායක මුදල් ගෙවන, සේවා නියුක්ති භාර අරමුදල ඇතුළු ඕනෑම අනුමත අර්ථ සාධක අරමුදලකට හෝ අනුමත විශ්‍රාම අරමුදලකට හෝ සකසුරුවම්, ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියකට හෝ සේවා නියුක්තිකයන් පමණක් දායක වනු ලබන ශුභ සාධක අරමුදලකට ඕනෑම අනුමත විශ්‍රාම පාරිතෝෂික අරමුදලකට උපචිත වන හෝ උපදාන පොළී මත ලාභ හා ආදායම නැතහොත් යම් තැනැත්තකුට ඇති වන හෝ උපචිත වන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභ නොවන) පොළී ආදායමට ;

(ඊ) මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව “නිශ්චිත ආයතනයක්” නොවන හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් ප්‍රධාන වශයෙන් මුල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවාවලට සමාන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකුට උපදින යම් ආදායමක් හැර, යම් තැනැත්තකුට උපදින ලාභාංශ ආදායමට ;

(ඇ) (i) 2002 ජූලි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන, 2004 ජනවාරි මස 1 වන දිනට පෙර අවසන් වන යම් බදු අයකළ හැකි කාල සීමාව ඇතුළත යම් තැනැත්තකු විසින්, සමාගමක ඒ තැනැත්තාට අයත් කොටස් විකිණීමෙන් ඒ තැනැත්තාට හෝ අන් තැනැත්තන් විසින් එවැනි කොටස් මිල දී ගෙන විකුණනු ලැබීමට උපකාරී වන යම් තැනැත්තකුට හෝ උපදින ලාභ හෝ ආදායම වන, මේ පරිච්ඡේදයෙන් අර්ථානුකූල යම් "නිශ්චිත ආයතනයකට" හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගමක් සපයන එවැනි සේවාවලට සමාන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකුට උපදින එවැනි ලාභ හෝ ආදායම් නොවන ලාභවලට හෝ ආදායමට;

(ii) 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, යම් තැනැත්තකු විසින් සමාගමක ඒ තැනැත්තාට අයත් කොටස් විකිණීමෙන් ඒ තැනැත්තාට උපදින ලාභ හෝ ආදායම හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් නොවන තැනැත්තන් විසින් එවැනි කොටස් මිල දී ගෙන විකුණනු ලැබීමට උපකාරීවන යම් තැනැත්තකුට උපදින ලාභ හෝ ආදායම වන, මේ පරිච්ඡේදයේ අර්ථානුකූල යම් "නිශ්චිත ආයතනයකට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගම් සපයන එවැනි සේවා වලට සමාන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකුට උපදින එවැනි ලාභ හෝ ආදායම නොවන ලාභ වලට හෝ ආදායමට ;

(ඈ) ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි මූලික වශයෙන් යෙදී සිටින තැනැත්තකුට හෝ මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව යම් " නිශ්චිත ආයතනයකට" හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවාවලට සමාන සේවා සපයන යම් තැනැත්තකුට උපදින හෝ උපචිත වන ලාභ හෝ ආදායම් හැර, ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමෙන් ලැබෙන ලාභවලට හෝ ආදායමට,

අදාළ කරගත යුතු එකතු කළ අගය ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණන් බලනු ලැබූ එකතු කළ අගයේ වටිනාකම, යම් ලිත් මාසයක් සම්බන්ධයෙන්, රුපියල් හැත්තැපන් දහසක් නොඉක්මවන්නේ නම් 25අ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම බද්දට යටත් කිසිම තැනැත්තකුගෙන් බදු අයකරනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "සමාගම් සමූහය" යන්නෙන්, මව් සමාගමට පාලිත සමාගම් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇත්තා වූ ද, එම පාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පාලනය කිරීම මගින් හෝ එම පාලිත සමාගම්වල සම කොටස් ප්‍රාග්ධනයේ නාමික වටිනාකමින් හරි අඩකට වැඩි ප්‍රමාණයක් දැරීම මගින් හෝ මව් සමාගම විසින් පාලිත සමාගම් පාලනය කරන්නා වූ ද අවස්ථාවක එම මුල් සමාගම සහ එහි සියලු පාලිත සමාගම් අදහස් වේ.".

(8) (3) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, 2004 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ ඉන් පසු ආරම්භ වන එක් එක් මාසය සඳහා ගෙවිය යුතු බද්ද (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන එකතු කළ අයගෙන් සියයට පහළොවක් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද,

(i) 2003 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භව 2004 ජනවාරි මස 1 වන දිනට පෙර අවසන් වන බදු අයකළ හැකි කාලසීමාව සඳහා, 22 වන වගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි ගණන් බලන ලද බදුවලට අදාළව, මේ පරිච්ඡේදය යටතේ හැර, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ –

(අ) සම්මත අනුප්‍රමාණ අනුව ගණන් බලන ලද යම් තැනැත්තකු විසින් යෙදවුම් බදු සඳහා බැර අඩුකිරීමෙන් පසුව කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබූ එවැනි යම් බද්දකින් සියයට පනහක් ;

(ආ) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි යම් තැනැත්තකු විසින් කල්බදු පහසුකම් සැපයුම් සම්බන්ධයෙන් ගෙවන ලද එවැනි යම් බද්දකින් සියයට විසිපහක්,

මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බදු වලින් අඩු කරනු ලැබිය යුතු ය ;

(ii) 2004 ජනවාරි මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, 22 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ගණන් බලන ලද බදු හා සම්බන්ධව, මේ පරිච්ඡේදය හැර මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ යම් තැනැත්තකු විසින් 2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු විසින් කල්බදු පහසුකම් සැපයීම වෙනුවෙන් සියයට විසිපහක සීමා කිරීමකට යටත්ව ගණන් බලා යෙදවුම් බදු සඳහා බැර අඩුකිරීමෙන් පසුව කොමසාරිස් ජනරාල්වරයාට ගෙවන ලද එවැනි යම් බද්දක්, මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බද්දෙන් අඩු කළ යුතු ය.”

(2) ඒ වගන්තියේ අතුරු විධානය අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :—

“එසේම තවදුරටත්, යම් ලියාපදිංචි තැනැත්තකු විසින් මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද, 25ඇ වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ගණන් බලනු ලබන අවස්ථාවක, මේ වගන්තියේ මීට පූර්ව විධිවිධාන ඒ ලියාපදිංචි තැනැත්තාට අදාළ නොවිය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය සංශෝධනය කිරීම.*

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ, 25ඊ වගන්තියේ (ඇ) ඡේදයේ “යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල” යන වචන වෙනුවට “ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අනුමත කරන ලද යම් බලපත්‍ර ලාභී වාණිජ බැංකුවක් ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා ක්‍රමයක් ප්‍රකාරව ඒ වාණිජ බැංකුව විසින් වෙනත් යම් තැනැත්තකුට එම බැංකුවේ අක්‍රිය ණය මුදල් පැවරීම හැර, යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියට 25උ වගන්තිය අළුතින් ඇතුළත් කිරීම.*

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 25උ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

“මේ පරිච්ඡේදයේ විධිවිධාන මූල්‍ය සේවා සපයන තැනැත්තකුට අදාළ විය යුතු බව.

25උ. යම් තැනැත්තකු මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අවස්ථාවක, මේ පරිච්ඡේදයේ ඉහතින් වූ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 2003 ජූලි මස 1 වන දින සිට බලපවත්වන පරිදි, ඒ තැනැත්තා විසින් සපයනු ලබන මූල්‍ය සේවාවලට සහ ඒ සේවා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.” .

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය එහි "යම් බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද, ඒ බදු අයකළ හැකි කාල සීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු ය." යන වචන වෙනුවට "යම් බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද ඒ බදු අයකළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14**. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ, "22 වන වගන්තියේ (4) වන උපවගන්තියේ" යන වචන වෙනුවට "22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ "22 වන වගන්තියේ (4) වන උපවගන්තියේ" යන වචන වෙනුවට "22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වගන්තිය ඉවත් කිරීම.

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**17**. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අන්තර්කාලීන විධිවිධාන.

76. (1) 2002 අගෝස්තු මස 1 වන දිනයේ දී හෝ ඉන් පසු හෝ, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි තැනැත්තකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ යම් නිදහස් කළ සැපයුම් කිරීමේ කාර්ය සඳහා භාණ්ඩ අත්කර ගැනීම මත බද්ද ගෙවා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ සැපයුම බදු අයකළ හැකි සැපයුමක් බවට ඉන් අනතුරුව යම් අවස්ථාවක පත්වුවහොත්, එවිට, එසේ අත්කර ගත් භාණ්ඩ, ඒ බදු අයකළ හැකි සැපයුම සඳහා ප්‍රථමයෙන් යොදා ගන්නා විට, ඒ තැනැත්තා විසින් එසේ ගෙවන ලද බද්ද යෙදවුම් බද්දක් ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, එසේ අත්කර ගත් භාණ්ඩ, යම් බදු අයකළ හැකි සැපයුමක් කිරීමෙහි ලා අර්ධ වශයෙන් පමණක් භාවිත කරන අවස්ථාවක, යෙදවුම් බද්දෙන්

ඉඩදිය හැකි ප්‍රමාණය, එම බදු අයකළ හැකි සැපයුම කරන තැනැත්තාගේ අත්කර ගැනීම්වල වටිනාකම, භාවිත කළ කාල සීමාව සහ මීට අදාළ විය හැකි වෙනත් යම් කාරණා සලකා බලා, කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කළ යුතු ය :

එසේම තවදුරටත්, අත්කර ගන්නා ලද යම් භාණ්ඩ හෝ සේවා, සම්පූර්ණයෙන්ම සහ අවසාන වන තෙක් නිදහස් කළ සැපයුම් සඳහා යොදාගෙන ඇති අවස්ථාවක, එම භාණ්ඩ හෝ සේවාවල තරාතිරම, නිදහස් කළ සැපයුම්වල සිට බදු අයකළ හැකි සැපයුම් ලෙස වෙනස්වීම් නිසා ඒ භාණ්ඩ හෝ සේවා පිළිබඳ යම් යෙදවුම් බද්දක්, බදු අයකළ හැකි සැපයුම් මත යෙදවුම් බද්දක් ලෙස ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(2) මේ පනතේ III අ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වන යම් නිශ්චිත ආයතනයක් හැර, 2003 ජූලි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සහතික කරනු ලබන මාසයේ අවසාන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට ඇති මුදලක් ගෙවීමට යටත් තැනැත්තකු විසින් එම මුදල පනත සහතික කරනු ලබන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර ගෙවනු ලබන්නේ නම් ඔහු එම මුදල නියමිත දිනයේ දී හෝ එදිනට පෙර ගෙවා ඇති ලෙස සළකනු ලැබිය යුතු ය. එම මුදල ගෙවනු නොලබන්නේ නම්, එම මුදල, එම ගෙවීම නියමිත දිනයේ සිට පැහැර හැර ඇති ලෙස සළකනු ලබන අතර, එම තැනැත්තා එම දිනයේ සිට බලපවත්වන පරිදි ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සළකනු ලැබිය යුතු ය.";

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ආශ්‍රිත තැනැත්තන්" යන්නෙහි අර්ථකථනයේ, (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"(අ) එකම කොටස් හිමියන්ගෙන් සමන්විත වන්නා වූ හෝ එකම අධ්‍යක්ෂවරුන් විසින් හෝ එකම සමාගමක් විසින් කළමනාකරණය හා පාලනය කරනු ලබන්නා වූ සමාගම් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් ; හෝ"

(2) "අධ්‍යාපන ආයතනය" යන්නෙහි අර්ථකථනය අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(ඇ) වෘත්තීය පුහුණුව හෝ ප්‍රායෝගික පුහුණුව සපයන්නා වූ සහ —

(i) අරමුදල් හෝ වෙනත් ආධාර ආණ්ඩුවෙන් සපයන හා එම පුහුණුව සපයන ආයතනයක් බවට අමාත්‍යවරයා විමසා තෘතියික අධ්‍යාපන හා පුහුණු කිරීමේ විෂය භාර අමාත්‍යවරයා අනුමත කරන්නා වූ ද;

(ii) ආයතනයේ අතිරික්ත අරමුදල් ඒ ආයතනය පවත්වාගෙන යාම සඳහා නැවත ආයෝජන කරන්නා වූ ද,

යම් ආයතනයක් අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "පළමුවන උපලේඛනය" යන ශීර්ෂයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"I වන කොටස

2002 අගෝස්තු මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භව 2004 ජනවාරි මස 1 වන දිනට පෙර අවසන් වන, බදු අයකළ හැකි කාලසීමාව සඳහා –"

(ආ) එම උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :—

(1) එම උපලේඛනයේ (xi) වන අයිතමයෙහි (එ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඒ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා ක්‍රමයක් හෝ ඒ බැංකුවේ වෙනත් යෝජනා ක්‍රමයක් ප්‍රකාරව එම බැංකුවේ අක්‍රීය ණය මුදල් වෙනත් තැනැත්තකුට පැවරීම ;";

(2) එම උපලේඛනයේ (xxii) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(xxii) ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින වෙනත් තැනැත්තකු හට ශ්‍රී ලංකාවෙන් පිටත දී පරිභෝජනය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවීම් කරනු ලබන සේවා සැපයුම ;"

(3) එම උපලේඛනයේ (xxviii) වන අයිතමයෙහි "අන්ධයන් සඳහා සුදු සැරයටි සහ බ්‍රේල් යතුරු ලියන හා කොටස්" යන වචන වෙනුවට " අන්ධයන් සඳහා සුදු සැරයටි සහ බ්‍රේල් යතුරු ලියන සහ කොටස් ද බ්‍රේල් ලියන කඩදාසි සහ බ්‍රේල් ලියන බෝඩ් ද" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම උපලේඛනයේ (xxxiii) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(xxxiii) 1980 අංක 27 දරන සුවඳ විළවුන් උපකරණ සහ ඖෂධ පනත මගින් පිහිටුවන ලද සුවඳ විළවුන් උපකරණ සහ ඖෂධ අධිකාරිය මගින් සහතික කරන ලද ඖෂධ නිෂ්පාදන හා බෙහෙත් ඇතුළු (සුවඳ විළවුන් හැර) ඖෂධ නිෂ්පාදන, බෙහෙත් සහ එම නිෂ්පාදන හා බෙහෙත් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය ;"

(5) එම උපලේඛනයේ (xxxvi) වන අයිතමයෙහි " කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සැපයුම හෝ ආනයනය." යන වචන වෙනුවට "කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සැපයුම හෝ ආනයනය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) එම උපලේඛනයේ (xxxvi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන් :—

"(xxxvii) යම් වාහනයක් ආබාධිත තැනැත්තකු විසින් භාවිත කරනු ලබන වාහනයක් ලෙස විශේෂයෙන් සැලසුම් කරන ලද වාහනයක් බවට අමාත්‍යවරයා සෑහීමට පත් වීමේ දී අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද ඒ ආබාධිත තැනැත්තා විසින් භාවිත කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණ කරන ලද්දා වූ වාහනයක් ආනයනය කිරීම ;

(xxxviii) යම් වෛද්‍ය යන්ත්‍රෝපකරණ, වෛද්‍ය උපකරණ හෝ ගිලන්රථයක් පිටරට සිටින තැනැත්තන්ගෙන් හෝ සංවිධාන වලින් හෝ ලැබෙන ත්‍යාග බවට අමාත්‍යවරයා සෑහීමට පත්වීමේ දී අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් සංවිධානයක් විසින් එම යන්ත්‍රෝපකරණ, වෛද්‍ය උපකරණ හෝ ගිලන්රථයක් ආනයනය කිරීම ;

(xxxix) අමාත්‍යවරයා විමසා තෘතීයික අධ්‍යාපන හා පුහුණු විෂය භාර අමාත්‍යවරයා විසින් මේ අයිතමයේ කාර්ය සඳහා අනුමත කරනු ලබන වෘත්තීය පුහුණු හා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන යම් ආයතනයකට ආණ්ඩුව මගින් අරමුදල් සපයා ඇති හා එම ආයතනයේ අතිරික්ත මුදල් එම ආයතනයේ නඩත්තුව සඳහා නැවත ආයෝජනය කරනු ලබන අවස්ථාවක, එම ආයතනය විසින් පුහුණුව ලබා දීමේ කාර්යය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන අයිතම ආනයනය කිරීම.".

(ඇ) පළමුවන උපලේඛනයේ 1 වන කොටසට [(xxxix) වන අයිතමයට] පසුව පහත දැක්වෙන අලුත් කොටස එකතු කිරීමෙන් :—

"II වන කොටස

2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන බදු අයකළ හැකි කාලසීමාව සඳහා –

(අ) (i) වී, බිත්තර වී, සහල්, තිරිඟු, කරදමුංගු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ගම්මිරිස්, කපාපු පොල්, රබර්, රබර් කිරි, අමුපොල්, පලාවර්ග, හාල්පිටි, තිරිඟු පිටි, පාන්, ළදරු කිරිපිටි, බිත්තර, කිරි (කිරිපිටිවලින් හෝ යම් ධාන්‍ය වර්ගයකින් සකස් නොකළ) ;

(ii) 1980 අංක 27 දරන සුවඳ විලවුන්, උපකරණ සහ ඖෂධ පනත යටතේ පිහිටුවන ලද විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය සහතික කළ යම් නිෂ්පාදන හා ඖෂධ ඇතුළු (සුවඳ විලවුන් නොවන) බෙහෙත් ද්‍රව්‍ය නිෂ්පාදන හෝ ඖෂධ සහ ඒ නිෂ්පාදන හෝ ඖෂධ නිෂ්පාදන හෝ නිපැයුම් සඳහා අමුද්‍රව්‍ය ;

(iii) ආයුර්වේද ඖෂධ නිගන්ටුවට අයත් ආයුර්වේදීය සංයෝග හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) ආයුර්වේදීය සංයෝග හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) යුනානි, සිද්ද හෝ හෝමියෝපතික සංයෝග සහ එවැනි සංයෝග සඳහා අමුද්‍රව්‍ය ;

(iv) ආනයනය කරන ලද දින සිට මාස 12ක් ඇතුළත ප්‍රතිඅපනයනය කරනු ලබන ගුවන් යානා, හෙලිකොප්ටර්, මුතු, දියමන්ති, ස්වභාවික හෝ කෘත්‍රිම මැණික් හෝ බාල මැණික්, දියමන්ති කුඩු, අගනා ලෝහ, අගනා ලෝහ ආලේපිත ලෝහ, රන්කාසි, සහ යම් පිරියත, යන්ත්‍ර සූත්‍ර හෝ උපකරණ හෝ ප්‍රදර්ශන භාණ්ඩ ලෙස සහ යම් තාක්ෂණික නිරූපණයක් සඳහා යොදා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ තාවකාලිකව ආනයනය කිරීම ;

(v) පොත්පත් (චෙක්පොත්, වාර ප්‍රකාශන, සඟරා, පුවත්පත්, දිනපොත්, ලෙජර් පොත් සහ අභ්‍යාස පොත් හැර) ශ්‍රී ලංකා ජනරජයේ හෝ පළාත් සභාවල පාවිච්චි නොකළ තැපැල් මුද්දර හා ආදායම් මුද්දර ;

(vi) බොර ඛනිජ තෙල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන සහ නැව් සඳහා තෙල් ;

(vii) කෘත්‍රිම අත්පා, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවණාධාර, එවැනි දුබලතාවක් හෝ ආබාධයක් සඳහා හානිපූරණය පිණිස පළඳින හෝ රැගෙන යන හෝ මිනිස් සිරුරේ තැන්පත් කෙරෙන එවැනි ආධාරක හෝ උවාරණ සඳහා උපාංග, අන්ධ පුද්ගලයින් සඳහා සුදු සැරයටි, බ්‍රේල් ටයිප් රයිටර් සහ කොටස්, බ්‍රේල් ලියන කඩදාසි හා බ්‍රේල් ලියන පුවරු ;

(viii) කෘෂිකාර්මික ට්‍රැක්ටර් ;

(ix) සෙලියුලර් ජංගම දුරකථන ;

(x) කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා පොහොර (2004.07.01 දින සිට බලපැවැත්වේ)

සැපයුම සහ ආනයනය.

(ආ) (i) ආණ්ඩුවෙන්, පළාත් සභාවකින් හෝ පළාත් පාලන ආයතනයකින් පුස්තකාල සේවා සපයනු ලබන, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා ආණ්ඩුවේ විෂය මාලාව අනුගමනය කරන අධ්‍යාපන ආයතනයක් හෝ රජයේ පාසලක් හෝ රජයෙන් ආධාර ලබන පාසල් විසින් අධ්‍යාපන සේවා සැපයීම. (2004.07.01 දින සිට බලපැවැත්වේ) ;

(ii) පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම (ගුවන් ප්‍රවාහනය, ජලය මගින් ප්‍රවාහනය, සංචාරකයින් ප්‍රවාහනය, සංචාරක ගමන් සහ කුලී රථ සේවා හැර) හෝ 2004 ජනවාරි මස 1 වන දිනට පෙර එවැනි කල්බදු ගිවිසුමකට එළඹ ඇත්නම් මගී ආසන 28 ට නොඅඩු ආසන ධාරිතාවක් සහිත පොදු මගී ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ලද මෝටර් කෝච් සඳහා කල්බදු පහසුකම් සැපයීම ;

(iii) (205 වන අධිකාරය වූ) විදුලිබල පනත යටතේ අර්ථකථනය කර තිබෙන පරිදි එක් පාරිභෝගිකයකුට මසකට කිලෝ වොට් පැ. 40ක් නොඉක්මවන විදුලි බල සැපයීම ;

(iv) සේවායෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තයන් සඳහා නොමිලේ හෝ සහනාධාර මත ඔවුන්ගේ සේවා ස්ථානයේ දී ආහාර සැපයීම, සේවායෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තයන් සඳහා මෝටර් කෝච් රථයකින් පදිංචි ස්ථානය හා සේවා ස්ථානය අතර නොමිලයේ හෝ සහනාධාර මත ප්‍රවාහනය සැපයීම ;

(v) යම් ආයතනයක් හෝ තැනැත්තකු විසින් භූමදාන සහ ආදාහන කටයුතු සම්බන්ධ සේවා සැපයීම ;

(vi) ශ්‍රී ලංකාවේ තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් තැනැත්තකුට, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී පරිභෝජනය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම සඳහා, ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවීම් මත සේවා සැපයීම ;

(vii) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ආගමන කවුන්ටරයෙන් ඔබ්බෙහි රෙස්ටෝරන්ට් සේවා සැපයීම ;

(viii) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රජයක දූත මණ්ඩලයක හෝ යම් සංවිධානයක හෝ ඒ දූත මණ්ඩලයේ හෝ සංවිධානයේ හිමිකම් ලබන කාර්ය මණ්ඩලවල සාමාජිකයන්ට රාජ්‍ය දූත කාර්ය මණ්ඩලයට භාණ්ඩ හා සේවා සැපයීම. එසේ වුව ද, ඉහත කී දූත මණ්ඩල වල, සංවිධානයේ ආයතනවල හා සාමාජිකයන්ගේ ශ්‍රී ලංකාවෙන් නියුක්ත ප්‍රතිරූපයන්ට ද අන්‍යොන්‍ය ලෙස ප්‍රතිරූපී ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලවලට එම ප්‍රතිලාභ ලැබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනා ගෙන තිබිය යුතු ය ;

(ix) ස්වභාවික මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ව්‍යසනවල දී හදිසි ආපදා සහන සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය පරිදි විදේශික සංවිධාන විසින් සෘජුව අරමුදල් සපයන භාණ්ඩ සැපයීම ;

(x) පහත දැක්වෙන මූල්‍ය සේවා, එනම් –

(අ) යම් ජංගම, තැන්පතු හෝ ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වා ගෙන යාම ;

(ආ) ව්‍යවහාර මුදල් හුවමාරුව ;

(ඇ) නෝට්ටුවක්, ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා මුදල් ගෙවීම, එකතු කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම ;

(ඈ) යම් තැනැත්තකු විසින් ණයවී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ යම් හිමිකමක් ඇත්තා වූ යම් ණය සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, අයිතිය පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහනය හෝ පිටසන් කිරීම ;

(ඉ) යම් සම කොටස් සුරැකුම්පතක් හෝ සහභාගී සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම හෝ අයිතිය පැවරීම ;

(ඊ) සම කොටස් සුරැකුම් පතක්, ණය සුරැකුම් පතක් හෝ සහභාගි සුරැකුම්පතක් නිකුත් කිරීම ප්‍රාරක්ෂණය කිරීම හෝ උප ප්‍රාරක්ෂණය කිරීම ;

(උ) යම් ණය මුදලක්, අත්තිකාරම් මුදලක් හෝ බැරපතක් සැපයීම ;

(ඌ) (අ) සැපයුම් ලාභියාට දැනුම් දී වෙනයම් වැය බරක් කරනු ලැබූ පහසුකමක් වන කොන්දේසි සහිත කුලී සින්නක්කර විකිණීමක දී හෝ ණයට විකුණුම් ගිවිසුමක දී වාරික ණය මූල්‍යකරණ පහසුකම් සැපයීමේ විධිවිධාන ;

(ආ) සපයන භාණ්ඩ, ගිවිසුමේ දිනය වන විට මාස දොළහකට අඩු නොවන කාලයක් ශ්‍රී ලංකාවේ පාවිච්චි කර තිබෙන විට, යම් කුලී සින්නක්කර ගිවිසුමක් හෝ කොන්දේසි සහිත ගිවිසුමක් යටතේ එම භාණ්ඩ සැපයීමේ විධිවිධාන ;

(එ) ජීවිත රක්ෂණය, " අග්‍රහාර" රක්ෂණය සහ අස්වනු සහ පශු රක්ෂණය ;

(ඒ) බලපත්‍රලත් වාණිජ බැංකුවක අක්‍රීය ණය මුදල්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ඒ වාණිජ බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමේ හෝ වෙනත් යෝජනා ක්‍රමයකට අනුව වෙනත් තැනැත්තකුට ඒ ණය මුදල් පැවරීමක් මගින් පවරාදීම ;

(xi) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්වී ඇති ව්‍යාවසායක් විසින් මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන හා ඒ ව්‍යාපෘතිය තනිකරම නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම සහ කුලියට දීම සඳහා වන, ඒ ගිවිසුම අදාළ ව්‍යාපෘතියක් මගින් නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම හෝ කුලියට දීම හැර, පදිංචිය සඳහා නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදු දීම හෝ කුලියට දීම ;

(xii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් 01 වන දින හෝ ඉන් පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇති වෛද්‍ය ආයතනයක් විසින්, මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන, ඒ ගිවිසුම අදාළ ව්‍යාපෘතියක් මගින් සෞඛ්‍ය ආරක්ෂක සේවා සැපයීම හැර, සෞඛ්‍ය ආරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන් විසින් හෝ සියලු සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීම ;

(ඇ) (i) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළවන යම් රජයක දූත මණ්ඩලයක හෝ යම් සංවිධානයක හෝ ඒ දූත මණ්ඩලයේ හෝ සංවිධානයේ රාජ්‍ය දූත කාර්ය මණ්ඩල සාමාජිකයන්ට, ප්‍රති-අපනයනය සඳහා වූ තාවකාලික පිළිගැනීමේ සහතිකයක් යටතේ ආනයනය කිරීම ඇතුළුව භාණ්ඩ ආනයනය කිරීම ;

(ii) රේගු ආඥාපනතේ 107 වන වගන්තිය යටතේ සාදන ලද මගී ගමන් බඩු (නිදහස් කිරීමේ) නියෝග යටතේ බදු රහිතව නිෂ්කාශනය කර ගැනීමට හිමිකම ඇති යම් භාණ්ඩයක් හෝ රේගු ආඥාපනතේ “අ” උප ලේඛනයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රති-අපනයනය කිරීමේ සහතිකය මත බදු රහිතව ලබාගත් භාණ්ඩයක් හෝ නැවක ගබඩාවේ ප්‍රයෝජනය සඳහා බැඳුම්කරයක් නොමැතිව නිෂ්කාශනය කරන භාණ්ඩ ආනයනය ;

(iii) යම් භාණ්ඩ විදේශීය තැනැත්තන්ගෙන් හෝ සංවිධානවලින්, ස්වාභාවිකව සිදු වූ හෝ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවූ හදිසි ආපදා සඳහා සහන සැලසීමට ත්‍යාග වශයෙන් වූ භාණ්ඩ බවට අමාත්‍යවරයා සෑහීමට පත්වී ඔහු විසින් අනුමත කරන ලද භාණ්ඩ නැතහොත් එම භාණ්ඩ වෛද්‍ය යන්ත්‍ර සූත්‍ර, උපකරණ, හෝ ගිලන් රථ වන අවස්ථාවක ඒ භාණ්ඩ ආනයනය ;

(iv) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ –

(අ) 1996 මැයි මස 16 වන දිනට පෙර හෝ ;

(ආ) මුළු පිරිවැය රුපියල් මිලියන 500 ට නොඅඩු පිරිවැයක් සහිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන්, 1998 අප්‍රේල් මස 1 වෙනි දිනට පෙර,

ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විසින්, ගිවිසුමේ නිශ්චිතව දක්වා තිබෙන ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස වූ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ලෙස නියම කර ඇති මේ ඡේදයේ කාර්ය සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා පළ කර තිබෙන සෘණාත්මක ලැයිස්තුවේ දැක්වෙන භාණ්ඩයක් නොවන භාණ්ඩ –

(i) ඒ ගිවිසුමේ නිශ්චිතව දැක්වෙන, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව ඇතුළත ; හෝ

(ii) ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තෙක් යන මෙයින් කලින් එළඹෙන දිනය දක්වා (ඒ දිනය 2003 නොවැම්බර් මස 19 වන දිනට කලින් ඇතුළත් වූ අවසන් ගිවිසුමේ දිනයේ සිට මාස තිස් හයකට වඩා පසු නොවිය යුතු ය.) කාලසීමාව ඇතුළත,

ආනයනය කිරීම ;

(v) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විසින්, ඒ ගිවිසුමේ නිශ්චිතව දැක්වෙන ව්‍යාපෘතිය සම්පූර්ණ කරනු ලැබීමෙන් පසු, නිදහස් කරනු ලැබූ සැපයුම් ව්‍යාපාරයෙහි පමණක් යෙදෙන ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ව්‍යාපෘතියට අදාළ භාණ්ඩයක් ලෙස නියමකර ඇති මේ ඡේදයේ කාර්ය සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා පළ කර තිබෙන සෘණාත්මක ලැයිස්තුවේ දැක්වෙන භාණ්ඩයක් නොවන භාණ්ඩ –

(අ) 2002 අගෝස්තු මස 1 වන දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ;

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තීරණය කරන පරිදි ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තෙක්,

යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා ආනයනය කිරීම ;

(vi) රුපියල් දසදහසකට නොවැඩි වටිනාකමකින් යුත් පෞද්ගලික අයිතම සහ ව්‍යාපාර සම්බන්ධ සාම්පල්, පාර්සල් තැපැලෙන් හෝ “කුරියර්” සේවා මගින් ආනයනය කිරීම ;

(vii) ආබාධිත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා විශේෂයෙන් සැළසුම් කළ මෝටර් වාහනයක් ඒ වාහනය යම් ආබාධිත තැනැත්තකුගේ ම පාවිච්චිය සඳහා බවට අමාත්‍යවරයා සෑහීමට පත්වීමෙන් පසුව අමාත්‍යවරයා අනුමත කරන ආබාධිත තැනැත්තකු විසින් ආනයනය කිරීම ;

(viii) අරමුදල් හෝ වෙනත් ආධාර ආණ්ඩුවෙන් සපයනු ලැබ ඇත්තා වූ ද, ආයතනයේ අතිරික්ත අරමුදල් ඒ ආයතනය පවත්වා ගෙන යාම හෝ වැඩි දියුණු කිරීම සඳහා නැවත ආයෝජනය කරන්නා වූ ද අමාත්‍යවරයා විමසා තෘතීයික අධ්‍යාපන හා පුහුණු කිරීම් අමාත්‍යවරයා අනුමත කරන වෘත්තීය පුහුණුව හෝ ප්‍රායෝගික පුහුණුව සපයන ආයතනයක් විසින් පුහුණුව සැපයීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් ප්‍රාග්ධන අයිතම ආනයනය කිරීම.

(ඈ) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සඳහා තීරුබදු රහිත සාප්පුවලට භාණ්ඩ ආනයනය හා සැපයීම ;".

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(අ) " දෙවන උපලේඛනය" යන ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්.

" 2002 අගෝස්තු මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භව 2004 ජනවාරි මස 1 වන දිනයෙන් අවසන්, බදු අය කළ හැකි කාලසීමාව සඳහා–

(1) ඒ උපලේඛනයේ (xviii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(xviii) සපයනු ලබන කල්බදු පහසුකමකට අදාළ කර ගත හැකි වූ ද, එහෙත් අදාළ කල්බදු ගිවිසුමේ ඇතුළත් කර නොමැති වූ ද, ලැබුණු යම් ගෙවීමක් හෝ 2003 ජුලි මස 1 වන දිනට පෙර ඇතුළත් වූ යම් කල්බදු ගිවිසුමක් යටතේ ගෙවිය යුතු යම් මුදලක් කලින් බේරුම් කිරීම සඳහා වූ ද මෙම ගිවිසුම මත අයවිය යුතු සම්පූර්ණ මුදලේ වටිනාකමින් සියයට දහයක ප්‍රමාණය ඉක්මවන්නා වූ ද යම් ගෙවීමක් හැර, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි යම් තැනැත්තකු විසින් මූල්‍යකරණ කල්බදු පහසුකම් සැපයුම ;"

(2) එම උපලේඛනයේ (xxiii) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(xxiii) රෙදි පිළි සහ අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදන සැපයීම හෝ ආනයනය කිරීම හෝ රෙදි පිළි ඩයි කිරීම සහ මුද්‍රණය කිරීමේ සේවා සැපයුම ;";

(3) එම උපලේඛනයේ (xxvi) වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(xxvi) බඩ ඉරිඟු, සෝයා බෝංචි ආහාර හෝ මත්ස්‍ය ආහාර සැපයුම හෝ ආනයනය කිරීම ;";

(4) එම උපලේඛනයේ (xxvii) වන අයිතමයේ "උපාංග සැපයුම හෝ ආනයනය" යන වචන වෙනුවට "උපාංග සැපයුම හෝ ආනයනය;"; යන වචන ආදේශ කිරීමෙන් ;

(5) එම උපලේඛනයේ (xxx) වන අයිතමයේ " ඉඩම් හා වැඩිදියුණු කිරීම් සැපයීම." යන වචන වෙනුවට "ඉඩම් හා වැඩිදියුණු කිරීම් සැපයීම;" යන වචන ආදේශ කිරීමෙන්.".

(6) එම උපලේඛනයේ (xxx) වන අයිතමයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන් :—

(xxxi) කෝර් එකකට වර්ග මිලි මීටර් 16ක් නොඉක්මවන සන්නායක හරස්කඩක් සහිත කෝර් හතර දක්වා වූ සන්නාහ සන්නද්ධ නොවන රැහැන් යන කේබල් සැපයුම හෝ ආනයනය කිරීම".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අතීතයට බලපෑම.

**22**. (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට —

(i) මේ පනතේ 2 (2) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 ජූනි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය ;

(ii) මේ පනතේ 2 (3) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2004 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය ;

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට, මේ පනතේ 4 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, 2003 ජූලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඈ) ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට මේ පනතේ 5 වන වගන්තියෙන් කරන ලද සංශෝධන 2004 ජූලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(ඇ) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට —

(i) මේ පනතේ 6 (1) වගන්තියේ අතුරු විධානයෙන් කරන ලද සංශෝධනය, 2003 ඔක්තෝබර් මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ii) මේ පනතේ 6 (2) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2002 අගෝස්තු මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(iii) මේ පනතේ 6 (3) සහ 6 (4) වගන්ති වලින් කරන ලද සංශෝධන, 2004 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඉ) ප්‍රධාන ප්‍රඥප්තියේ III අ පරිච්ඡේදය 2003 ජූලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඊ) ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තියට මේ පනතේ 8 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2003 ජූලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(උ) ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තියට මේ පනතේ 12 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2003 ජූලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඌ) ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට, මේ පනතේ 13 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2004 ජූලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(එ) ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වගන්තියට, මේ පනතේ 16 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2004 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඒ) ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියට, මේ පනතේ 17 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2004 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඔ) ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියට –

(i) මේ පනතේ 18 (1) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2004 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ii) මේ පනතේ 18 (2) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 සැප්තැම්බර් මස 17 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ඕ) ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයට –

(i) මේ පනතේ 19 (ආ) (1) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 මාර්තු මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ii) මේ පනතේ 19 (ආ) (2) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 මාර්තු මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(iii) මේ පනතේ 19 (ආ) (3) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(iv) මේ පනතේ 19 (ආ) (4) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 මාර්තු මස 1 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(v) මේ පනතේ 19 (ආ) (6) වගන්තියෙන් කරන ලද සංශෝධනය, 2003 ඔක්තෝබර් මස 17 වන දින දී බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය;

(ක) ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට මේ පනතේ 20 වන වගන්තියේ (1), (2), (3,) (4) සහ (6) උපවගන්ති වලින් කරන ලද සංශෝධන 2003 ජුලි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.